# කොළඹ දිසා අධිකරණයේදී ය.

නඩු අංකය : 3155/විශේෂ

දිනය : 1990.09.18 වෙනි දිනදී ය.

## නියෝගය.

මෙම නඩුවේ දී පැමිණිලිකරු වෙනුවෙන් ඔහුගේ පැමිණිල්ල සමඟ දිවුරුම් ප්‍රකාශය ද එයට යා කළ ලේඛණ ද ඉදිරිපත් කරමින් පැමිණිලිකරු 4 වැනි විත්තිකාර සමාගම් කොටස්කරුවෙකු බවත් 4 වැනි විත්තිකාර සමාගම 1, 2, 3 වෙනි සමාගම් අතර හෝටල් සංකීර්ණ ගොඩනැගීම වෙනුවෙන් ඇති වූ ගිවිසුම සම්බන්ධයෙන් කටයුතු ගිවිසුමට අනුකූලව ඉටුකර නැතැයි යන පදනම මත එම ගිවිසුම මත ගෙවිය යුතු හෝ ලැබිය යුතු යයි කියන මුදල් සම්බන්ධයෙන් මෙම නඩුවේ අවසාන තීරණයක් කරන තෙක් පියවර ගැනීම එකී 1, 2, 3 වෙනි විත්තිකාර පක්ෂය ද 4 වෙනි විත්තිකාර අනෙක් පක්ෂය ද වශයෙන් තහනම් කරන ලද අතුරු තහනම් නියෝගයක් ඉල්ලා ඇත.

ඉදිරිපත් කළ කරුණු සළකා බලා පැමිණිල්ලේ ආයාචනයේ (උ) සහ (ඌ) යටතේ වූ අතුරු තහනම් නියෝගය පිළිබඳ නිවේදන සහ එම නිවේදන පිළිබඳව දැක්විය හැකි විරෝධතාවයක් පසුව කෙරෙන නියෝගය තෙක් අතර පවත්වන එවැනි වූ වාරණ නියෝගයක් ද නිකුත් කිරීමේ අවශ්‍යතාවය පිළිගනිමි.

ඒ අනුව ඉහත කී පරිදි වූ පැමිණිල්ලේ ආයාචනයේ (උ) ජේදය යටතේ අතුරු තහනම් නියෝග පිළිබඳ නිවේදන සහ වාරණ නියෝගය 1, 2, 3 වෙනි විත්තිකරුවන්ට ද (ඌ) ජේදය යටතේ අතුරු තහනම් නියෝගය පිළිබඳ නිවේදන සහ ඒ වාගේම වාරණ නියෝගයක් 4 වෙනි විත්තිකරුට ද නිකුත් කිරිමට නියම කරමි.

මෙම අතුරු තහනම් නියෝගය පිළිබඳ නිවේදනය සහ වාරණ නියෝගය මෙම නඩුවේ සිතාසි ද සමඟ එකී 1, 2, 3, 4 වෙනි විත්තිකරුවන් වෙත නිකුත් කිරීමට නියම කරමි.

අත්සන් කළේ /-

දිසා විනිසුරු - කොළඹ.

(පී.විජයරත්න) 1990.09.17

------------------------

ඉහත දැක්වෙනුයේ කොළඹ දිසා අධිකරණයේ අංක.3155/විශේෂ දරණ නඩුවේ කාර්ය සටහන්වල සහ 1990.09.18 දින දරණ නියෝගයේ සත්‍ය පිටපතක් බව මෙයින් සහතික කරමි.

අති. රෙජිස්ට්‍රාර්

සතුරු ලිව්වේ :-

සැසඳුවේ :-

9/18 - 307769




අධිකරණය
1990-9-28